IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය

දෙවන
**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)**

## BLE 307- අලෙවි කළමනාකරණය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(1)** **ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. වර්තමාන අලෙවිකරණ පරිසරය තුල කළමනාකරුවෙකුට අලෙවිකරණයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදය හමුවේ පාරිභෝගික අපේක්ෂාවන්හි සිදු වූ වෙනස්කම් උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

02.

i. පාරිභෝගිකයාගේ මිලදී ගැනීමේ තීරණ ක්‍රියාවලිය සුදුසු උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. භාණ්ඩ නිෂ්පාදන ජීවන චක්‍රයෙහි එක් එක් අදියරයන්හිදී අලෙවි කළමනාකරුවෙකුට ගත හැකි උපායමාර්ග දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

03.

i. අලෙවිකරුවෙකුට වෙළඳපල ඛණ්ඩනයේ ඇති වැදගත්කම දක්වා ශ්‍රී ලංකාවේ ඇඟලුම් වෙළඳපල ඛණ්ඩනය කලහැකි ආකාරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පවතින වර්තමාන තත්වය අනුව භාණ්ඩයක මිල උපක්‍රමය තීරණය කිරීමේදී/වෙනස් කිරීමේදී සලකා බැලිය යුතු සාධක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

04.

i. ප්‍රචාරණය හා ප්‍රසිද්ධිය යන්න නිර්වචනය කර ඒ අතර ඇති වෙනස්කම් තුනක් (03 ක්) විස්තර කරන්න.

(ලකුණු 10)

ii. ඔබ තෝරාගන්නා කර්මාන්තයක් සඳහා මයිකල් පෝටර් විසින් හඳුන්වා දෙනු ලැබූ පස් වැදෑරුම් බලවේගයන් විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

05. පහත සඳහන් සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඉලක්ක වෙළඳපල

ii. සේවා අලෙවි මිශ්‍රය

iii. නිෂ්පාදන ජීවන චක්‍රය

iv. අලෙවිකරණ සංකල්ප

v. ආවරණය කිරීමේ උපායමාර්ග

(ලකුණු 5 x 5 = 25)

*************

IHRA

UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)**

# BLE - 308 ශ්‍රමයේ නූතන ප්‍රවණතා

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03) .

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**ප්‍රශ්න අංක 01**

i. සාම්ප්‍රදායික වැඩ සැකසුම් සහ නිවසේ සිට වැඩ කිරීම ඇතුළු නවීන වැඩ සැකසුම් අතර ඇති වෙනස්කම් සුදුසු උදාහරණ සමඟින් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. නවීන වැඩ සැකසුම් හා සම්බන්ධ සමාජ ගැටලු මොනවාද?

(ලකුණු 15 )

(මුළු ලකුණු 25 )

**ප්‍රශ්න අංක 02**

i. 'වෘත්තීය සමිතිවාදය සේවකයින් අතර සාපේක්ෂ වශයෙන් අප්‍රසාදයට පත් වී ඇත. එවැනි තත්වයක් ඇතිවීම සඳහා විය හැකි හේතු හඳුනාගෙන විස්තර කරන්න.

(ලකුණු 10)

ii. වර්තමානයේ වෘත්තීය සමිතිවාදය මුහුණ දී ඇති අප්‍රසාදය වෙනස් කිරීමට ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 15 )

(මුළු ලකුණු 25 )

**ප්‍රශ්න අංක 03**

i. වත්මන් ශ්‍රම සංක්‍රමණය ඔබ සලකන්නේ බුද්ධිගලනයක් ලෙසද? උදාහරණ සමඟ විස්තර කරන්න.

(ලකුණු 10)

ii. වර්තමාන ශ්‍රම සංක්‍රමණ ප්‍රවණතාවය සඳහා හේතු විය හැකි සාධක සහ එහි ගුණාංග සාකච්ඡා කරන්න.

(ලකුණු 15 )

(මුළු ලකුණු 25 )

**ප්‍රශ්න අංක 04**

කෙටි සටහන් ලියන්න.

i. අභ්‍යන්තර සහ බාහිර සංක්‍රමණය
ii. සේවක හඬ සහ බලගැන්වීම
iii. ජාත්‍යන්තරකරණය එදිරිව දේශීයකරණය
iv. තනි කේවල් කිරීම සහ සාමූහික කේවල් කිරීම
v. ගිවිසුම්ගත වැඩ එදිරිව ස්ථිර වැඩ සේවකයින්

(ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 )

************

IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණ

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)**

## BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

I. කොවිඩ් වසංගතය විදේශ විනිමය ඉල්ලුමට හා සැපයුමට කෙසේ බලපෑම් කලේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05 )

II. කොවිඩ් වසංගතය නිසා පාවෙන විනිමය අනුපාතයේ හැසිරීම වෙනස් වූ ආකාරය විස්තර කරන්න

(ලකුණු 05 )

III. වසංගත කාලයක් තුල විදේශ විනිමය පාලනය කෙසේ සිදු කල යුතුද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05 )

IV. රටක විදේශ විනිමය කාලයෙන් කාලයට වෙනස් විය යුතුද? ඔබේ පිළිතුර විස්තර කරන්න

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02.

I. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කොවිඩ් වසංගතය හා උද්ධමනය කෙසේ බලපෑම් කලේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. කොවිඩ් වසංගතය හා පිරිවැයෙන් තල්ලුවූ උද්ධමනය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

III. කොවිඩ් වසංගත කාලය තුල උද්ධමනය ඇතිකල හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

IV. කොවිඩ් වසංගතය නිසා වූ ආර්ථික බලපෑමට පිලියමක් ලෙස විදේශ ආයෝජන ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03.

I. දිළිඳුභාවයේ විෂම චක්‍රය කොවිඩ් වසංගතය නිසා කෙසේ වූවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. දේශීය ඉතිරිකිරීම් ආර්ථික කටයුතු සඳහා උපරිම අන්දමින් භාවිතා කලහැකි ආකාරය පහදන්න.

(ලකුණු 05)

III. කොවිඩ් වසංගතය කාලය තුල ගනු ලැබූ රාජ්‍ය මූලය හා බදු ප්‍රතිපත්ති මොනවාද ?

(ලකුණු 05)

IV. ගෝලීයකරණය හා ශ්‍රී ලංකා ආර්ථිකයේ හැසිරීම කොවිඩ් වසංගතය කාලය තුල කෙසේ වූවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04.

I. කොවිඩ් වසංගතය කාලය තුල මෙරට ජාත්‍යන්තර වෙළදාමේ හැසිරීම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. ගෙවුම් ශේෂයට හැසිරීමට කොවිඩ් වසංගතය කෙසේ බලපෑවේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

III. කොවිඩ් වසංගතය කාලය තුල ගෙවුම් ශේෂය අවම කර ගැනීමට ගත් ක්‍රියා මාර්ග මොනවාද ?

(ලකුණු 05)

IV. ගෝලීයකරණයේ වාසි මොනවාද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05.

I. ආර්ථික විද්‍යාඥ ආතර් ලුවිස් (Arthur Lewis)ගේ ද්විත්ව ආර්ථික න්‍යායයේ ග්‍රාමීය අංශය හා නාගරික අංශය සංසන්දනය කරන්න.

(ලකුණු 05)

II. ආර්ථික විද්‍යාඥ ආතර් ලුවිස් (Arthur Lewis)ගේ ද්විත්ව ආර්ථික න්‍යායයේ වාසි පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 05)

III. තිරසාර සංවර්ධන ඉලක්ක විස්තර කරන්න.

(ලකුණු 05)

IV. ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය ලංකාවට ගැලපෙන එකක්ද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06.

I. ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරන්න

(ලකුණු 05)

II. අදායම් විෂමතාව මැනිය හැකි ක්‍රම පිළිබඳව විස්තර කරන්න .

(ලකුණු 05)

III. ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාව අවම කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග මොනවාද?

(ලකුණු 05)

IV. දිළිඳුකම විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07.

I. ශ්‍රී ලංකාවේ දිළිඳුකම අවම කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග මොනවාද ?

(ලකුණු 07)

II. දිළිඳුකම මැනිය හැකි ක්‍රම පිළිබඳව විස්තර කරන්න

(ලකුණු 06)

III. ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ උපනතිය කෙබඳු එකක් වේද?

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

08.

I. රාජ්‍ය ණය ආපසු ගෙවීම පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 10)

II. රාජ්‍ය අයවැය ලේඛනයෙහි අයවැය හිඟය පියවීම විග්‍රහ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**************